7/04/2016

**ද මැසනඩ් විද්‍යාලය**

12 වෙනි ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය

2016 අප්‍රේල්

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.**

කාලය පැ. 02

Learning Center De Mazenod College Kandana

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I - කොටස

01. සන්නිවේදනය ගැන වැරදි ප්‍රකාශයක් විය නොහැක්කේ
   - i. සන්නිවේදනය ජීව විද්‍යාත්මක හා තාක්ෂණික විද්‍යාත්මක ගවේෂණයක ප්‍රතිඵලයකි.
   - ii. සන්නිවේදනය ජීවීන්ගේ පැවැත්ම හා ආරක්ෂාව වෙනුවෙන් දායාද වූවකි.
   - iii. සන්නිවේදනය සඳහා වුවමනාවක් හා උනන්දුවක් තබිය යුතුය.
   - iv. සන්නිවේදනය සඳහා සංවේදී ඉන්ද්‍රියන් ක්‍රියාත්මක විය යුතුය.
   - v. සන්නිවේදනය උසස් මනසක් ඇති මිනිසා විසින් බිහි වූවකි.

02. ගෝලීයකරණය හා සන්නිවේදනය ගැන සඳහන් විය හැකි ප්‍රකාශය,
   - i. එය ලෝක සමාජය සංකීර්ණ කරවයි.
   - ii. එය සාම්ප්‍රදායික චින්තනයන් ව්‍යාප්ත කරයි.
   - iii. එය ජාතික රාජ්‍යයන් තුල ඇති ජාතික සංකල්ප වර්ධනය කරයි.
   - iv. එය සන්නිවේදන විකාශනයේ නවතාවයන් ඇති කරයි.
   - v. එය මානව පරිනාමයේ විශේෂ අවධියකි.

03. R.L. බ්‍රොහියර් (රජයේ මිනින්දෝරුවෙකු ලෙස සේවය කළ ) ශ්‍රී ලංකාව ගැන ලියූ ග්‍රන්ථයන්
   - i. ඔහුගේ සමීක්ෂණ වාර්තා වේ
   - ii. සන්නිවේදන ප්‍රවණතා වේ
   - iii. ඔහුගේ ගවේෂණයන් වල ප්‍රතිඵලයකි.
   - iv. නිගාමී තර්කනයන් වේ
   - v. උද්ගාමී තර්කනයන් වේ

04. කරුණාව, දයාව, අනුකම්පාව ආදීන් හඳුනාගත හැක්කේ,
   - i. පුද්ගලයෙකුගේ සමාජානුයෝජනයේ ප්‍රතිඵලයක් ලෙසයි
   - ii. අන්තර්පුද්ගල සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙසයි
   - iii. අන්තර් වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙසයි
   - iv. සහානුභූතියේ ප්‍රතිඵලයක් ලෙසයි
   - v. මානව සාරධර්මවල ප්‍රතිඵලයක් ලෙසයි.

05. සමාජානුයෝජනය ලෙස හැඳින්වෙන්නේ,
   - i. තමා සිටින පරිසරයට අනුව කරන සන්නිවේදනයයි.
   - ii. තම අවශ්‍යතා වෙනුවෙන් හැඩ ගැසීමයි
   - iii. තම සන්නිවේදන කුසලතාවයන් ඉදිරිපත් කිරීමයි
   - iv. මාධ්‍යය හැසිරවීමේදී දක්වන කුසලතාවයයි.
   - v. තම පරපුරෙන් ලැබෙන සන්නිවේදන හැකියාවයි.

06. වාර පරීක්ෂණයට පෙනී සිටින ශිෂ්‍යයෙකු පිළිතුරු සපයනවා වෙනුවට වටපිට බලමින් හෝ නිදාගනිමින් සිටියි. ඔහු තුල දකිය හැක්කේ,
   - i. ඉගෙනීමේ දක්ෂ සිසුවෙකු පෙන්නුම් කරන ලක්ෂණ නොවේ
   - ii. අන් අයට සන්නිවේදන බාධාවන් ඇති කරවන ලක්ෂණ වේ.
   - iii. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදයේ දුර්වලතාවයන් වේ
   - iv. සාක්ෂරතා දැනුමෙන් අඩු ලක්ෂණ වේ
   - v. ඉද හිට පාසල් එන ශිෂ්‍යයෙකුගේ ලක්ෂණ වේ.

07. අනාථ ළමා නිවසයකට දානපතියෙකු විසින් ලබා දීමට සුදුසු පරිත්‍යාගයක් වන්නේ,
i. මව් ගුණ ගැන කියැවෙන සංයුක්ත තැටි
ii. උසස් තාක්ෂණයෙන් යුක්ත රූපවාහිනී යන්ත්‍රයකි.
iii. වර්ණවත් පිටකවර සහිත ඉගෙනුමට අවශ්‍ය කරන අභ්‍යාස පොත්
iv. සම වයස් වල සිටින අනෙකුත් යහපත් දරුවන් අත් විඳින දේ
v. අන්තර්ජාල පහසුකම්

08. "ධනවර්ධන" සිය දෙමුහුන් වර්ගයේ මෝටර් රථය 'ටින්ටඩ්' (කළු පැහැ) කරගත්තේ,
i. තමා අයත් සංයුතිය පෙන්වීමට
ii. තමා සතුව ඇති ආර්ථික හැකියාව පෙන්වීමට
iii. තමා සාමාජික බල අධිකාරියට අයත් බව හැඟවීමට
iv. තමා දේශීය චින්තනයෙන් මිදී ලොව ඇති ප්‍රවණතාවලට අයත් වූවකු බව පෙන්වීමට
v. තමා ප්‍රජාමූල සාමාජිකයෙකු බව හැඟවීමට

09. A ආහාර B ආරක්ෂාව C වර්ගයා බෝ කිරීම D සෞඛ්‍යය
ඉහත කරුණු වලින් සන්නිවේදනය ඇතිවීමට බලපෑවේ
i. ABC
ii. ABD
iii. ACD
iv. BCD
v. සියල්ලම

10. ශ්‍රී ලංකාවේ මුලින්ම මුද්‍රණය වූයේ
i. සරසවි සඳරැස
ii. ඥානාර්ථ ප්‍රදීපය
iii. ලංකා ලෝකය
iv. රිවිරැස
v. Sunday Observer

11. දේශපාලන විද්‍යාවේ මහාචාර්ය වරයෙකු ලෙස මෙන්ම සන්නිවේදන විෂයේ විද්වතෙකු ලෙස පිළිගැනෙන්නේ

i. විල්බර් ශ්‍රාම් ii. චාල්ස් ඔස්ගුඩ් iii. විමල් දිසානායක
iv. හැරල්ඩ් ඩී. ලැස්වෙල් v. එඩ්වඩ් සැපියර්

12. "ප්‍රතිපෝෂණය" ගැන පවසන නිවැරදි කරුණක් නම්,
i. සන්නිවේදකයාට නැතිවම බැරිය
ii. සාර්ථක සන්නිවේදනයට නැතිවම බැරිය
iii. ග්‍රාහකයාට නැතිවම බැරිය
iv. සන්නිවේදනයට නැතිවම බැරිය
v. ග්‍රාහකයාගේ බුද්ධිමත්බව පෙන්වීමට නැතුවම බැරිය

13. ප්‍රතිපෝෂණය ගැන තම නිර්වචනය ගැන සඳහන් කලේ
A ලැස්වෙල් B ෂැනොන් හා වීවර් C විල්බර් ශ්‍රාම් D එඩ්වඩ් සැපියර්
i. A ii. B iii. C iv. D
v. ඉහත කිසිවෙකු නෙවේ

14. සෑම මානව ක්‍රියාවක් පිටුපස ම සන්නිවේදය ගැබ් වී ඇති බව ප්‍රකාශ කලේ,
i. හැරල්ඩ් ලැස්වෙල් ii. ෂැනොන් හා වීවර් iii. එඩ්වඩ් සැපියර්
iv. විල්බර් ශ්‍රාම් v. ඩැනියෙල් ලර්නර්

7.04.2016 12 ශ්‍රේණිය
සන්නිවේදනය

Learning Resource Center
R
De Mazenod College
Kandana

15. ගුරුවරයා සතු දැනුම ඒ අයුරින් සිසුවා තුළ අවබෝධකරලීම තේරුම් ගත හැක්කේ,

i. සන්නිවේදන බාධා අවම වූ තත්වයන් යටතේය.
ii. වෛවර්ණ මුද්‍රිත නිබන්ධන සැපයීම යටතේය.
iii. මාධ්‍ය පරිහරණයේ කුසලතාවයන් යටතේය
iv. සන්නිවේදන මෙවලම් ලෙස මුද්‍රිත සටහන් සැපයීම නිසාය
v. සිසුවාගේ ප්‍රතිපෝෂණය ලැබීම යටතේය.

16. ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍යය ගැන නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. 80 දශකයේ ආරම්භය / ජාතික රූපවාහිනිය
ii. 80 දශකයේ ආරම්භය / ස්වාධීන රූපවාහිනිය
iii. 70 දශකයේ / ජාතික රූපවාහිනිය
iv. 80 දශකයේ අවසානය/ ජාතික රූපවාහිනිය
v. 80 දශකයේ අවසානය/ ස්වාධීන රූපවාහිනිය

17. "සන්නිවේදකයා"

i. තම භාෂාවෙන් සන්නිවේදනය කළ යුතුය
ii. ග්‍රාහකයාගේ භාෂාවෙන් සන්නිවේදනය කළ යුතුය.
iii. මාධ්‍යයට අදාල භාෂාවෙන් සන්නිවේදනය කළ යුතුය.
iv. ග්‍රාහකයාට දෙදෙනාට පොදු සංකේත වලින් සන්නිවේදනය කළ යුතුය.
v. පැහැදිලි හා යහපත් ලෙස ප්‍රතිපෝෂණය භාර ගත යුතුය.

18. A ග්‍රාහකයා, සන්නිවේදකයා ගැන විමසිලිමත් වේ.
B. සන්නිවේදකයා, ග්‍රාහකයා ගැන විමසිලිමත් වේ.
C. ග්‍රාහකයා තැනට සුදුසු අයුරින් ප්‍රතිපෝෂණය දක්වයි.
ඉහත ABC මගින් වඩාත් හොඳින් විස්තර වන්නේ

i. පාසල් පන්ති කාමරයක සිසුවා ගැන
ii. එළිමහන් සංගීත සන්දර්ශනයක් නරඹන ප්‍රේක්ෂකයා ගැන
iii. ගෘහස්ථ රූපවාහිනී ප්‍රේක්ෂකයා ගැන
iv. වෙළඳ පාරිභෝගිකයා ගැන
v. මෝස්තර නිරූපිකාවක් ගැන

19. "බටහිරකරණය " කාලාන්තරයක් ඔස්සේ දැකිය හැකි සමත් ප්‍රවණතාවයකි. ඊට හේතු විය හැක්කේ

i. නූතන මාධ්‍ය සංස්කෘතියකට ආශා කරන පිරිසක් සිටින නිසාය
ii. සාම්ප්‍රදායික මතයන්ගෙන් සමාජය හෙම්බත් වී ඇති නිසාය.
iii. නූතන සන්නිවේදන තාක්ෂණය ක්‍රමයෙන් දියුණු වන නිසාය
iv. ක්‍රම-ක්‍රමයෙන් ගෝලීය සමාජයක් ඇති කරන්නට ගන්නා ප්‍රතිඵලයක් ලෙසය
v. විලාසිතාවන් ඇති ප්‍රියතාවයන් නිසාය.

20. සන්නිවේදන මෙවලමක් රහිතව සිදුවන අන්තර්පුද්ගල සන්නිවේදනය යනු දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය සන්නිවේදන අවස්ථාවකි. කණ්ඩායම් සන්නිවේදනයට සාපේක්ෂව එහි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ,

i. සන්නිවේදකයා භාෂාව යොදා ගැනීමයි
ii. ග්‍රාහකයා හොඳින් ශ්‍රවණය කිරීමයි.
iii. සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවර වීමයි.
iv. නිර්වාචික සන්නිවේදනය ප්‍රබල වීමයි.
v. පුද්ගලයින් දෙදෙනෙකු අතර සිදුවීමයි

21. "පෙළඹවීම" සන්නිවේදනයේ ඉලක්ක ගත කාර්යයක් විය හැකිය. ඒ සඳහා ග්‍රාහක ආකල්ප හා හැසිරීම් වෙනස් කිරීමේ අරමුණින් පණිවිඩය සකස් කරන අතරම පණිවිඩයේ තාර්කික බවට වඩා භාවයන් පිළිබඳ අවධනය යොමු කෙරෙයි.
ඉහත තත්වයන් දැකිය හැකි වන්නේ,
i. දේශපාලන සන්නිවේදයේදී ii. ආගමික සන්නිවේදනයේදී
iii. ප්‍රචාරණයේදී iv. පරිසරාත්මක සන්නිවේදනයේදී
v. අන්තර් පුද්ගල සන්නිවේදනයේදී

22. විකල්ප ජනමාධ්‍ය පිළිබඳව මිතුරන් කිහිප දෙනෙකු අතර ඇති වූ සංවාදයකදී මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
නිමල් - ලාභයක් ලබන්න පුළුවන් වුනත් ඒක ප්‍රධාන අරමුණ නෙවෙයි.
කමල් - ඒ වුනාට ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය වලට අභියෝගයක් එල්ල කරනවා
අමල් - ඒත් ඒ අය ඉලක්ක කරගන්නේ කුඩා ග්‍රාහක කණ්ඩායමක්
විමල් - කොහොම වුනත් ඒවායේ තියෙන්නේ අපක්ෂපාතී ජනමාධ්‍ය භාවිතයක්

ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ විකල්ප ජනමාධ්‍ය වලට අදාල ප්‍රකාශ කර4න්නේ

i. නිමල් සහ කමල් ii. නිමල් සහ අමල්
iii. නිමල්, අමල්, සහ කමල් iv. කමල්, අමල් සහ විමල් v. සියලු දෙනාම

23. ජනමාධ්‍ය තොරතුරුවල දැකිය හැකි වඩාත් කැපී පෙනෙන ගුණාංගය වන්නේ
i. දෛනිකත්වයයි. ii. ඓතිහාසිකත්වයයි
iii. සංකීර්ණත්වයයි iv. විශ්‍රාන්තිකත්වයයි v. විවිධත්වයයි

24. තහඩු වහල සහිත ශාලාවක පැවැත්වෙමින් තිබූ දේශනය දේශකයා හදිසියේ නැවැත්වූවේ ඇද හැලුනු වර්ෂාව නිසාවෙනි. වහලයෙන් මතු වූ ඝෝෂාව කටහඬ ඉක්මවා යාම හේතු විය. මෙය
i. අර්ථ බාධකයකි ii. පරිසර බාධකයකි
iii. මාධ්‍ය බාධකයකි. iv. අර්ථ මෙන්ම මාධ්‍ය බාධකයකි.
v. පරිසර මෙන්ම මාධ්‍ය බාධකයකි.

25. මානවයා සතු සංඥා භාවිතා කිරීමේ හැකියාව
i. සමාජ උරුමයකි ii. ප්‍රවේනික සාධකයකි
iii. ස්වභාවික උරුමයකි iv. ජීව විද්‍යාත්මක උරුමයකි
v. අධි ස්වාභාවික උරුමයකි.

26. සමාජයක අධෝව්‍යුහයේ පැවැතිය හැක්කේ
i. නිෂ්පාදන බලවේග ii. ආගම iii. දේශපාලනය
iv. සංස්කෘතිය v. ජනමාධ්‍ය

27. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී පසුව මුදවා ගත් කණ්ඩායම,
i. අහඹු කණ්ඩායමකි ii. ඉගෙනුම් කණ්ඩායමකි
iii. ප්‍රතිපත්ති සැලසුම් කණ්ඩායමකි iv. සංස්කෘතික කණ්ඩායමගකි
v. විශෝධන කණ්ඩායමකි

28. ඊ. එල්. තොණ්ඩයිස් විසින් කුසගිනි වූ බළලෙකු කෑම පිඟානට සමීප වන ආකාරය පිළිබඳ පරීක්ෂණ තුළින් ලෝකයට ඉදිරිපත් කළ ඉගෙනුම හඳුන්වනු ලබන්නේ,
i. බහු බුද්ධි න්‍යාය ii. ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යාය
iii. ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යාය iv. ගෙස්ටෝල්ට් න්‍යාය v. පෙළඹවීම න්‍යාය

29. මුද්‍රණ ශිල්පය ආරම්භ වන්නේ
i. වහල් යුගයේ ii. වැඩ වසම් යුගයේ iii. ධනේශ්වර යුගයේ
iv. සමාජවාදී යුගයේ v. ගෝත්‍රික යුගයේ

7-04-2016
සන්නිවේදනය

30. ලේඛනය ආරම්භ වන්නේ,
i. වහල් යුගයේ ii. වැඩ වසම් යුගයේ iii. ධනේශ්වර යුගයේ
iv. සමාජවාදී යුගයේ v. ගෝත්‍රික යුගයේ

31. ලංකාවේ මුල්ම සිංහල පුවත්පත
i. කලම්බු ජර්නල් ii. ලංකා ලෝකය
iii. ලක්මිණි පහන iv. ඥාණාර්ථ ප්‍රදීපය
v. ලංකාදීප

32. ලංකාවේ මුල්ම විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය වන්නේ,
i. දුරකථනය හා විදුලි පණිවිඩ ii. විදුලි පණිවිඩ හා රූපවාහිනිය
iii. රූපවාහිනිය හා ගුවන් විදුලිය iv. අන්තර්ජාලය හා රූපවාහිනිය
v. දුරකථනය හා රූපවාහිනිය

33. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය වර්ධනයට දායක වූ චින්තකයින් නොවන්නේ,
i. ජෝන් ලොක් ii. ජෝන් මිල්ටන් iii. තෝමස් හොබ්ස්
iv. තෝමස් වරික් කයින්ඩ් v. ජෝන් ස්ටුවට් මිල්

34. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල සුබවාදී ප්‍රභල සිදුවීම් ජාත්‍යන්තර ජනමාධ්‍ය වාර්තාකරනුයේ ඔවුන්ගේ දේශපාලන සංකල්ප යටතේය මෙවැනි තත්වයන් හොඳින් පැහැදිලි කර ගත හැක්කේ
i. දෙපියවර සංකල්පයෙනි ii. සංවර්ධනාත්මක සංකල්පයෙනි
iii. ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයෙනි iv. දොරටුපාල සංකල්පයෙනි
v. ගෝලීයකරණ සංකල්පයෙනි

35. සන්නිවේදන බාධා පිළිබඳව වඩාත් පැහැදිලිව දක්වන ආකෘතිය
i. ෂැනොන් වීවර් ආකෘතිය ii. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය
iii. ඩේවිඩ් කේ බර්ලෝ ආකෘතිය iv. විල්බර් ශ්‍රාම් ආකෘකිය
v. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය

36. කේතකරණය පිළිබඳව වඩාත් පැහැදිලිව දක්වන ආකෘකතිය
i. ෂැනොන් වීවර් ආකෘතිය ii. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය
iii. ඩේවිඩ් කේ බර්ලෝ ආකෘතිය iv. විල්බර් ශ්‍රාම් ආකෘකිය
v. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය

37. ජීව විද්‍යාත්මක බව වඩාත් පැහැදිලිව දක්වන ආකෘතිය
i. ෂැනොන් වීවර් ආකෘතිය ii. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය
iii. ඩේවිඩ් කේ බර්ලෝ ආකෘතිය iv. විල්බර් ශ්‍රාම් ආකෘකිය
v. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය

38. සන්නිවේදනය පිළිබඳ පැහැදිලි කිරීමක් වන්නේ,
i. තොරතුරු සම්බන්ධතාවයකි ii. තොරතුරු සම්ප්‍රේෂණය සහ ලබා ගැනීමේ ක්‍රියාවලියකි
iii.පොදු ජන සන්නිවේදන මාධ්‍ය භාවිතා වීමකි
iv. ප්‍රතිග්‍රාහක සන්නිවේදක දෙපාර්ශවයම උපකරණ භාවිතා කිරීමකි.
v. පුද්ගල ක්‍රියාවලියකි.

39. විවිධ සන්නිවේදන අවස්ථාවල ප්‍රතිපෝෂණය සිදුවේ. එවැනි අවස්ථා වලට සාපේක්ෂව ජන සන්නිවේදනයේදී ප්‍රතිපෝෂණය
i. අසීමිතය, ක්ෂණිකය ii. සීමිතය, ප්‍රමාදය iii. සීමිතය, ක්ෂණිකය
iv. සාමාන්‍යයෙන් පමා වූ ස්වරූපයක් හා විටෙක නොකෙරෙන තරම්ය.
v. අතිශය සාර්ථකව සිදු වේ.

40. විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලියකදී බාධකයක් නොවන්නේ,
i. ගුවන් යානයක් ඉහළින් පියාසර කිරීමයි
ii. පරිසරයේ අධික උෂ්ණත්වයක් හා ආර්ද්‍රතාවයයි
iii. ග්‍රාහකයාගේ අසනීප තත්වයයි iv. මාධ්‍ය දැනුම නොමැතිවීමයි.
v. ආවරණ කලාපය තුළ සිටීමයි

41. වියදමින් අඩු සහ සන්නිවේදකයාගේ කුසලතාවය මැනවින් පෙන්වන සන්නිවේදන මෙවලම වන්නේ,
i. මයික්‍රොෆෝනය ii. ස්ලයිඩ් ප්‍රොජෙක්ටරය iii. කළු ලෑල්ල
iv. චිත්‍ර කලාව v. මූර්ති නිර්මාණ

42. බලපෑම ගැන සඳහන් නිර්වචනය වන්නේ,
i. ෂැනොන් වීවර්ගේ නිර්වචනයයි ii. ලැස්වෙල්ගේ නිර්වචනයයි
iii. ශ්‍රාම්ගේ නිර්වචනයයි iv. චාල්ස් කූලිගේ නිර්වචනයයි v. මේ කිසිවක් නොවේ.

43. පූර්ව මැතිවරණ අවස්ථාවකදී ජනමාධ්‍ය තුළ ප්‍රභලව කැපී පෙනෙන්නේ
i. පවතින තත්වය ඒ අයුරින්ම පෙන්වා දීමයි
ii. ආයතනික ප්‍රතිපත්ති මත කිසියම් පක්ෂයක් ඔසවා තැබීමයි
iii. මතවාදී කාර්යයි.
iv. උපදෙස් සම්පාධන කාර්යයි.
v. සංවිධානමය කාර්යයි.

44. සන්දේශය වඩාත් හොඳින් විස්තර වන්නේ කවර ආකෘතියකද ?
i. ලැස්වෙල් ii. බර්ලෝ iii. ශ්‍රාම් - ඔස්ගුඩ් iv. ඇරිස්ටෝටල් v. වීවර්

45. විමල් තුළ සිතිවිල්ලක් පහළ විය. ඔහු එම සිතිවිල්ල සංකේත බවට පත් කරයි. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය අනුව විමල්
i. විකේතීකරය වේ ii. ආකේතීකරය වේ
iii. විකේතීකරය මෙන්ම ආකේතීකරයද වේ. iv. සන්නිවේදකයා වේ
v. ග්‍රාහකයා වේ

46. රූපවාහිනී මාධ්‍ය ගැන වඩාත් නිදොස් විය හැක්කේ,
i. ඒක මාර්ගික සන්නිවේදන ස්වභාවයක් ඇත
ii. ප්‍රතිපෝෂණ තත්වයන් ඉහළය iii. දොරටුපාල සංකල්පයේ වාරණයන්ට හසු නොවේ
iv. අධික වියදම් සහිත මාධ්‍යයකි v. සන්නිවේදකයින් තම රූපය ගැන සැලකිලිමත් වේ.

47. දොරටුපාල සංකල්පය වඩාත් හොඳින් දැකිය නොහැකි වන්නේ,
i. ගුවන් විදුලි මාධ්‍යයේදී ii. නවකතාකරණයේදී iii. කටකථා තුළදී
iv. ධර්ම දේශනාවකදී v. පාසැල් බිත්ති පුවත්පත තුලදී

48. විධිමත් සන්නිවේදනයේදී
i. තොරතුරු බොහෝ විට නිවැරදිය ii. සන්නිවේදකයා මාධ්‍යවේදියෙකු වේ
iii. ග්‍රාහකයා සන්නිවේදකයා විසින් නොදනී
iv. මාධ්‍ය පරිශීලනය පවතින තත්වයන්ට අනුව සිදුවිය යුතුය
v. මාධ්‍යය යනු නව අදහස් රැගෙන යන ප්‍රපංචයකි.

49. බස් රථයක ගමන් කරන මගියෙකුට සිය ජංගම දුරකථනය නාද වීම නොඇසෙන්නේ,
i. අර්ථ බාධා නිසා ii. පරිසර බාධා නිසා iii. මාධ්‍ය බාධා නිසා
iv. තාක්ෂණික බාධා නිසා v. වයස් බාධා නිසා

50. සමූහ සන්නිවේදනයේදී නායකයෙකු විසින් සිදුවිය යුත්තේ,
i. සිය අනුගාමිකයාගේ වාචික මෙන්ම නිර්වාචික සන්නිවේදනය තේරුම් ගැනීමය
ii. සම්මුතියට හා විසම්මුතියට ඉඩදීමය
iii. හැකියාවන් ඇති පුද්ගලයින් ඉදරියට ගැනීමය
iv. අනුගාමිකයින්ගේ නර්වාචික සන්නිවේදනයන් ගැන සැලකිලිමත්වීමය
v. සහවේදනය හා සමාජානුයෝජනය සඳහා සිය සමාජිකයින් පුහුණු කිරීමය

7 . 04 . 2016

# ද මැසනඩ් විද්‍යාලය

## 12 වෙනි ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය

## 2016 අප්‍රේල්

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.

කාලය පැ. 03

Learning Resource Center R De Mazenod College Kandana

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

### II - කොටස

01. i. පිළිගත් නිර්වචනයක ඇසුරින් සන්නිවේදන ක්‍රියාවලියේ ස්වභාවය පැහැදිලි කරන්න.
    ii. සන්නිවේදනයේ මූලිකාංග 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.
    iii. අධිපතිවාදී සංකල්පය හා නිදහස් මතවාදී සංකල්පය සන්සන්දනය කරන්න.
    iv. ස්ව සංකල්පය යන්න හඳුන්වන්න

02. i. සන්නිවේදනයේ කාර්යයන් 5 ක් නම්කරන්න.
    ii. සන්නිවේදනයේ වර්ගීකරණයන් කීයද? ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.
    iii. සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර දක්නට ඇති සමාන අසමානතා 3 බැගින් දක්වන්න.
    iv. සන්නිවේදන විධි දක්වා, ඒවායින් 2 ක් පැහැදිලි කරන්න.

03. i. ප්‍රජා මූල හා ව්‍යාපාර මූල සංවිධාන කෙටියෙන් හඳුන්වන්න.
    ii. සමාජය බෙදා ඇති ස්ථර 2 නම් කර ඒ තුළ පවතින දෑ ලියා දක්වන්න.
    iii. ඥාන ගවේෂණය යන්න පැහැදිලි කරන්න.
    iv. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය පිළිබඳව පුවත්පතකට ලිපියක් සකසන්න.

04. i. ඥාන ගවේෂණයේදී උපයෝගී කර ගන්නා ක්‍රමවේදයන් 5 නම් කරන්න.
    ii. සමාජානුයෝජනය පැහැදිලි කරන්න.
    iii. සමාජානුයෝජනය සඳහා බලපාන සාධක 3 පැහැදිලි කරන්න.
    iv. සහානුභූතිය කෙටියෙන් හඳුන්වන්න.

05. i. ගෝලීයකරණ සංකල්පය කෙටියෙන් හඳුන්වන්න.
    ii. පුරවැසි මාධ්‍යයේ මූලික ලක්ෂණ 3 ක් දක්වන්න.
    iii. විකල්ප ජනමාධ්‍යයක ලක්ෂණ 4 ක් නම් කර, ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
    iv. සන්නිවේදන ආකෘති 2 ක් ගෙන ඒවායේ වෙනස්කම් 2 බැගින් ලියන්න.